**ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය - 2017**

---

ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1988 අංක 77 දරන ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ 7 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තුමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

---------------------------------------------

(i) ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම වෙන වෙනම තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණු අතර ඉඩම් වෙනුවෙන්ද සියයට 05 ක ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ii) කෞතුකාගාරයේ ඇති පෞරාණික වටිනාකමින් යුත් වත්කම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය තුලදී පුනරාවර්තන ස්වරූපයේ වියදම් සඳහා වැය කරන ලද එකතුව රු.153,129 ක් ප්‍රාග්ධනිත කර තිබුණු අතර එම අගය මත රු.6,334 ක් ක්ෂය සඳහාද වෙන්කර තිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් 1998 වර්ෂයේදී ජේ.ආර්. ජයවර්ධන තොරතුරු මධ්‍යස්ථානය නැමති පෞද්ගලික සමාගමක කර තිබුණු ආයෝජනයේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 4.3 ක් ලෙස දක්වා තිබුණු අතර 2008 වර්ෂයේදී මෙම ආයතනය වසා දැම්මේදී එහි වත්කම් රු.61,500 කට අගය කර තිබුණි.ආයතනය වසා දමා වර්ෂ 9 ක් ගත වී තිබුණද එම අයකරගත නොහැකි ශේෂය හා වත්කම් සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මධ්‍යස්ථානයේ වත්කම් ලෙස දක්වා ඇති වටිනාකම රු.59,419,511 ක් වූ අයිතමයන් 16 ක අයිතිය සහ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට අදාළ ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන සහ පුද්ගලයන්ට කුලියට දී තිබුණු ගොඩනැගිලි වෙනුවෙන් වර්ෂ දෙකකට වඩා පැරණි රු.2,324,708 ක කුලී මුදලක් අයවිය යුතුව තිබුණු අතර මධ්‍යස්ථානය විසින් එම කුලී මුදල් අයකරගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.370,825 ක් වූ හර ශේෂ 07 ක් හා එකතුව රු.272,222 ක් වූ බැර ශේෂ 5 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | |
| (i) මුදල් රෙගුලාසි 135 | මූල්‍ය බලතල පවරා දීමේ විධිමත් ක්‍රමයක් මධ්‍යස්ථානය තුල ස්ථාපිත කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 880 | මුදල් භාරව සිටින නිලධාරීන්, වවුචර් සහතික කරන සහ චෙක්පත් අත්සන් කරන නිලධාරීන් විසින් ඇප තැබිය යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1971අංක 38 දරන මුදල් පනතේ 16 වන වගන්තිය | බැංකු අයිරා ලබා ගැනීමේදී පාලක මණ්ඩලයේ හා මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව රු.1,693,242 ක උපරිමයක් දක්වා බැංකු අයිරා ලබා ගෙන තිබුණු අතර අයිරා පොළී වශයෙන් රු.20,810 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව කාර්මික සහකාර සහ විදුලි කාර්මික තනතුරු දරන සේවකයන් දෙදෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන දීමනා ලෙස රු.106,800 ක් ගෙවා තිබුණි. |
| (ඈ) 2016 දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක 2004/පුස/01/(2016 -සංශෝධිත) චක්‍රලේඛයේ 3.1 වගන්තිය | වාර්ෂිකව පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන වාර්තාවේ නිර්දේශ මාස 3 ක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට පවත්වන ලද සමීක්ෂණය විධිමත් පරිදි අවසන් කර නොතිබුණු අතර සමීක්ෂණ වාර්තා විගණිත දිනය වූ 2018 අප්‍රේල් 30 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2015 දෙසැම්බර් 09 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2015 පදනම් කරගනිමින් මධ්‍යස්ථානය විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ලෙස රු.411,916 ක් 2017 දෙසැම්බර් 29 දින ගෙවා තිබුණ ද චක්රලේඛය ප්‍රකාරව ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.10,756,476 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,510,103 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,246,373 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ගොඩනැගිලි කුලී ආදායම් රු.5,136,959 කින්ද ස්ථාවර තැන්පතු පොලී රු.2,551,520 කින්ද වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.7,523,410 ක් වූ අතිරික්තය 2014 සහ 2015 වර්ෂවලදී ඌනතාවයක් වී නැවතත් 2016 හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තයක්ද වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.20,207,834 ක් වූ දායකත්වය 2014 වර්ෂය වන විට රු.11,474,265 ක් දක්වා අඩු වුවද 2015 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.32,451,885 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මධ්‍යස්ථානයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ සැලකීමේදී සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 7.1:1 ක් හා ක්ෂණික වත්කම් අනුපාතය 6.9:1 ක්ව පැවතුන අතර ඉකුත් වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතයද සමාලෝචිත වර්ෂයේ අනුපාතයන්ට සමාන විය. ජංගම වත්කම් තුල සියයට 80 ක් කෙටිකාලීන ආයෝජන නියෝජනය කරන අතර ඒ අනුව මධ්‍යස්ථානයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුල රඳවා තිබුණු බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

ක්‍රියාකාරී සැලැස්ම අනුව වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.9,273,500 ක් වූ ඉලක්කගත කාර්යයන් 26 කින් රු.7,648,500 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් යුත් කාර්යයන් 21 ක් සිදුකර නොතිබුණි. මින් ඇස්තමේන්තුගත පිරිවැය රු.7,028,500 ක් වූ කාර්යයන් 18 ක්ම 2016 වර්ෂයේදී ද ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වූ කාර්යයන් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 හි 4.2.2 ඡේදය ප්‍රකාරව මාසික මූල්‍ය ප්‍රකාශන සෑම මසකම පාලක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර 4.2.3 (අ) සහ (ආ) ප්‍රකාරව මාස 06 කට වරක් කාර්යසාධන වාර්තා පාලක මණ්ඩලයේ සාකච්ඡාකිරීම හා එම වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම කළ යුතු වුවද 2017 වර්ෂය සඳහා පවත්වා තිබුනේ එක් පාලක මණ්ඩල රැස්වීමක් පමණක් විය. එමෙන්ම එම පාලක මණ්ඩල රැස්වීමේදී 2017 වාර්ෂික අයවැය ලේඛනය හා ක්‍රියාකාරී සැලැස්ම ඉදිරි පාලක මණ්ඩල රැස්වීමකට යොමුකරන ලෙස දක්වා තිබුණු නමුත් ඉන් පසු පාලක මණ්ඩලය රැස්වී නොතිබුණු බැවින් 2017 වර්ෂයේ අයවැය ලේඛනය හා ක්‍රියාකාරී සැලැස්ම පාලක මණ්ඩලයෙන් අනුමත වී නොතිබුණි.

(ආ) විධිමත් සේවා ගිවිසුමක් හෝ විධිමත් පත්වීම් ලිපියකින් තොරව ලේකම් ජනරාල්වරයාගේ ලිඛිත ඉල්ලීම අනුව මධ්‍යස්ථානයේ පුස්තකාලයේ සම්පත් සංරක්ෂණය සඳහාත් කෞතුකාගාර සහ ලේඛනාගාර අංශවල පරිපාලනමය කටයුතු පවත්වාගෙන යාම සඳහාත් විශේෂඥ දැනුම ලබාගැනීමේ අරමුණින් මහාචාර්යවරයෙකු සහ පොත් බැඳුම් හා ලේඛන සංරක්ෂණ කටයුතු අධීක්ෂණය වෙනුවෙන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේඛන සහකාරවරියකගේ සේවය 2014 වර්ෂයේ සිට ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මහාචාර්යවරයාට රු.329,725 ක් ද ලේඛන සංරක්ෂණ කටයුතු අධීක්ෂණයට පැමිණෙන නිලධාරිණියට රු.40,460 ක් ද ගෙවා තිබුණි.

(ඇ) වාර්ෂික අයවැය ලේඛනය අනුව 2017 වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ආදායම් ලෙස රු.22,632,000 ක් හඳුනාගෙන තිබුණද වර්ග අඩි 17,343 කින් යුත් ගොඩනැගිලි පරිශ්‍රය කුලියට ලබාදීමේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් වාර්ෂික තක්සේරු කුලී වාර්තාවක් ලබා නොගෙන විවිධ මාසික කුලී යටතේ කුලියට ලබාදී තිබුණි.

(ඈ) උතුරු මාර්ග ව්‍යාපෘතියට අදාල කාර්යාලයක් පවත්වාගෙන යන පරිශ්‍රයට අදාළව 2017 සැප්තැම්බර් 26 දින ඇතිකරගන්නා ලද ගිවිසුමේ කොන්දේසි අංක 01 ප්‍රකාරව රු.900,000 ක තැන්පතුවක් ලබාගත යුතු වුවත් එසේ ලබාගැනීමට කටයුතු නොකර රු.75,000 බැගින් වූ මාසික වාරික 12 කින් එම තැන්පතුව අයකර ගෙන තිබුණි.

(ඉ) 2017 වර්ෂය සඳහා බදු දී තිබුණු ගොඩනැගිලි වෙනුවෙන් ජල බිල්පත් සඳහා රු.499,200 ක මුදලක් මධ්‍යස්ථානය විසින් ගෙවා තිබුණු අතර කුලී පදනම මත ලබාදීමේදී ඇති කර ගත් ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාරව යම් සාධාරණ මුදලක් ජල බිල්පත් වෙනුවෙන් බදුකරුවන්ගෙන් අයකර ගතයුතු බවට සඳහන් වුවත් මධ්‍යස්ථානය විසින් බදු කරුවන්ගෙන් ජල බිල්පත් වෙනුවෙන් මුදලක් අයකර ගෙන නොතිබුණි.

(ඊ) මධ්‍යස්ථානය විසින් ගිවිසුම් අංක 459 මගින් 2013 ජනවාරි 15 සිට 2017 ජනවාරි 14 දින දක්වා රු.445,600 ක මාසික කුලියකට වර්ග අඩි 4,456 ක් කුලියට දීම සඳහා 2013 පෙබරවාරි 14 දින ජාවා ආයතනය සමග ගිවිසුම් ගතව තිබුණි. විගණිත දිනය වූ 2018 මාර්තු 31 දින වනවිට මෙම ආයතනයෙන් රු.1,314,843 ක කුලී මුදලක් අයවීමට තිබුණු අතර එම ආයතනයට අයත් උපකරණ කාර්යාල භූමියෙන් ඉවත්කර ගෙන නොතිබීම නිසා එම භූමි ප්‍රමාණය වෙනත් ඵලදායී කාර්යයකට යොදවාගැනීමටද නොහැකි වී තිබුණි.

(උ) මධ්‍යස්ථානය විසින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල සමග 2016 සැප්තැම්බර් 01 සිට 2018 අගෝස්තු 31 දක්වා වර්ග අඩි 1,830 ක් වර්ග අඩියක් රු.150 බැගින් මාසික කුලියට දීම සඳහා 2016 ජූලි 08 දින ගිවිසුමකට එළඹ තිබුණද ගොඩනැගිල්ලේ අලුත් වැඩියා කටයුතු නිම කිරීම ප්‍රමාද වීම හේතුවෙන් අදාල පරිශ්‍රය එම ආයතනයට ලබාදීම 2017 පෙබරවාරි 28 දින දක්වා ප්‍රමාද වී තිබුණි. මේ හේතුවෙන් රු.1,647,000 ක කුලී ආදායමක් මධ්‍යස්ථානයට අහිමිවී තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

මධ්‍යස්ථාන පුස්තකාලයේ විකිණීම සඳහා පවතින පොත් වර්ග 04 කින් පිටපත් 2000 ක් මුද්‍රණයකිරීම වෙනුවෙන් මධ්‍යස්ථානය විසින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට රු.264,040 ක මුදලක් 2013 දෙසැම්බර් 18 දින ගෙවීම් කර තිබුණි. 2018 මාර්තු 14 දින වන විට පොත් වර්ග 02 කින් පිටපත් 1,000 ක් ලැබී තිබූ අතර ඉතිරි පිටපත් 1,000 මධ්‍යස්ථානය වෙත විගණිත දිනය වූ 2018 මාර්තු 31 වන විටත් ලැබී නොතිබුණි.එමෙන්ම වටිනාකම රු.349,020 ක් වූ විකිණීම සඳහා තිබූ පොත් 978 ක් භාවිතයට ගත නොහැකි ලෙස හානි වී තිබුණි.

## 4.4 නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

මධ්‍යස්ථානය විසින් 2013 වර්ෂයේදී රු.309,120 කට මිලදීගෙන තිබූ යතුරු පැදියක් ධාවන තත්ත්වයේ පැවතියද 2015 වර්ෂයේ සිට භාවිතයට නොගෙන ආයතන පරිශ්‍රය තුළ අනාරක්ෂිත පරිදි ගාල්කර තිබුණි. මෙම යතුරු පැදිය සඳහා 2017 වර්ෂය දක්වා රක්ෂණ, ආදායම් බලපත්‍ර සහ දුම් පරීක්ෂණ ගාස්තු සඳහා රු.52,735 ක වියදමක් දරා තිබුණ බවද නිරීක්ෂණය විය.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 හි 9.2 පරිච්ඡේදයේ (ආ) සහ (ඇ) වගන්ති ප්‍රකාරව සෑම ආයතනයකම සංවිධාන සටහනක් සහ අනුමත කරගත් කාර්ය මණ්ඩලයක් තිබිය යුතු අතර, එම සංවිධාන සටහන සහ අනුමත කාර්ය මණ්ඩල තොරතුරු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුය. නමුත් මධ්‍යස්ථානයේ දැනට සේවයේ නියුතු 31 දෙනෙකුගෙන් සමන්විත කාර්යමණ්ඩලය සඳහා පාලක මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර සංවිධාන සටහන සහ අනුමත කාර්යමණ්ඩල තොරතුරු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ 9.3.1 (අ) වගන්තිය අනුව මධ්‍යස්ථානයේ බඳවාගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟත්වය ඇතිව පාලක මණ්ඩලයේ සහ අදාළ අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

----------------------

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම

------------------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 'න්‍යාය පත්‍රය' ප්‍රකාරව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව සියළුම රාජ්‍ය ආයතන දැනුවත් විය යුතු වුවද, මධ්‍යස්ථානය ඒ සම්බන්ධයෙන් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එකී කාර්යයන් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයයන් හඳුනාගෙනද නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 අප්‍රේල් 24 දිනදීය.

### 6.2 අයවැය පාලනය

අයවැයගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 09 සිට සියයට 1261 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මධ්‍යස්ථානයේ ලේකම් ජනරාල් වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) බදු කුලී ආදායම් | තක්සේරු වාර්තා ලබානොගැනීම හා බදු ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මක නොවීම. |
| (ආ) පුස්තකාල පරිපාලනය | පොත් අනාරක්ෂිතව ගබඩා කර තිබීම සහ ලේඛන සංරක්ෂණය කර නොතිබීම. |
| (ඇ) උපදේශන සේවා ගෙවීම් | විධිමත් ගිවිසුමකින් තොරව උපදේශන සේවා ලබාගැනීම. |
| (ඈ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයක් සිදුනොකිරීම. |
| (ඉ) උත්සව සහ සම්මන්ත්‍රණ ශාලා ආදායම් | මුදල් භාරගැනීම සඳහා ඇති පරිගණක පද්ධතියේ සහ මුදල් රැස්කිරීමේ අභ්‍යන්තර පාලනයේ දුර්වලතා පැවතීම. |
| (ඊ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම. |